**ශීර්ෂය - 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 11 කට අදාලව එකතුව රු. 49,000,000 ක් වූ ප්‍රතිපාදනවලින් රු.16,721,479 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය සියයට 24 සිට සියයට 72 දක්වා පරාසයක විය. | ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘති, කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය. ඊට අමතරව අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව අනිවාර්ය ඉතිරිකිරීම් ලෙස සලකා මහා භාණ්ඩාගාරය වෙත වාර්තා කරන ලදී. | සපයා ගනු ලැබූ ප්‍රතිපාදන අදාල කාර්යයට යෙදවිය යුතු බව. |
| (ආ) | වැය විෂයය අංක 2003 ට අදාලව ශුද්ධ ප්‍රතිපාදනය රු. 800,000 ක් වුවද මුළු වියදම රු. 249,857 ක් වීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රු.700,000 ක ප්‍රතිපාදන අවුරා තැබීමට සිදු වී තිබුණි. | 2003 යටතේ අනිවාර්ය ඉතිරිකිරීම රු.700,000 ක් ලෙස සඳහන් කලද ඊට පසුව ලද අත්‍යාවශ්‍ය බිල්පත් සඳහා ගෙවීම සිදුකරන ලදී. ඒ තුළින් ප්‍රතිපාදන සීමාව ඉක්මවා ගොස් නොමැති අතර අවසන් ගිණුම්වල 2003 වැය විෂය යටතේ ඉතිරිය රු.550,143 ක් ලෙස පෙන්නුම් කෙරේ. | අවශ්‍යතාවය අනුව ප්‍රතිපාදන ලබා ගත යුතු බව. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වු නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 1982 අංක 33 දරන වකුෆ් පනතේ 4 වන පරිච්ඡේදය | | | | |
| | (i) 43(2) වගන්තිය | | ලියාපදිංචි මුස්ලිම් පල්ලියක, පුණ්‍ය භාරයක වාර්ෂික ශුද්ධ ආදායමෙන් සියයට 6 ක ප්‍රමාණයක්ද, මුස්ලිම් සිද්ධස්ථානයක වාර්ෂික ශුද්ධ ආදායමෙන් සියයට 10 ක ප්‍රමාණයක් ද, මුස්ලිම් පුණ්‍යාධාර අරමුදලට ලබා දිය යුතු බව සඳහන් වුවද අදාල පල්ලි | මුස්ලිම් පුණ්‍යාධාර අරමුදලට ලබා දිය යුතු පුණ්‍යාධාර ප්‍රමාණය පරික්ෂා කිරීම සඳහා දැනට ක්‍රමවේදයක් හඳුන්වා දී ඇති අතර එම ක්‍රමවේදය | පනත ප්‍රකාරව ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතු බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | සහ සිද්ධස්ථාන වෙතින් ලැබිය යුතු නියම මුදල මුස්ලිම් පුණ්‍යාධාර අරමුදලට ලැබෙන බවට පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් හඳුනා ගෙන නොතිබුණි. | ක්‍රියාත්මක වෙමින් පවතී. | |
| | (ii) 43(8) වගන්තිය | | අරමුදලේ ගිණුම් පවත්වා ගැනීමට සහ විගණනය කිරීමට කටයුතු කළ යුතු වුවද, 2016 වර්ෂයේ සිට අරමුදලේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2016 වර්ෂයේ සිට 2021 දක්වා ගිණුම් පිළියෙළ කර වකුෆ් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර අනුමැතිය ලද විගස විගණනය වෙත යොමු කරන බව දන්වා සිටිමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු බව. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | (i) මුදල් රෙගුලාසි 214 | 668,508 | සමාලෝචිත වර්ෂයට අදාල බැරකම්, බැරකම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. | අදාල බැරකම් මේ වනවිට බැරකම් ලැයිස්තුවේ සටහන් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම් ලේඛනයේ ඇතුළත් කළ යුතු බව. |
| | (ii) මුදල් රෙගුලාසි 396 | 324,702 | නිකුත් කර මාස 06 ක් ඉකුත් වූ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මාස 6 ඉක්මවූ රු.324,702 ක් වටිනා චෙක්පත් කඩිනමින් රාජ්‍ය ආදායමට බැරකිරීම සඳහා ප්‍රායෝගික ගැටළුවක් පවතින බැවින් තාවකාලිකව තැන්පත් ගිණුමට මාරු කර ඇති අතර ගැටළු නිරාකරණය කර සියල්ල 2022 දෙසැම්බර් 31 දිනෙන් පසුව රාජ්‍ය ආදායමට බැර කරන බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 ඡේදය | | දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන හජ් අරමුදල පාර්ලිමේන්තුවේ පනතක් මගින් නීත්‍යානුකූලව පිහිටුවා නොතිබුණු අතර චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල වසා දැමීමට හෝ නීත්‍යානුකූල තත්ත්වය ලබා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. එමෙන්ම අරමුදලට අදාල මූල්‍ය ප්‍රකාශන මෙතෙක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණද පාලක මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණු අතර 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයට අනුව අරමුදලේ මුළු වත්කම රුපියල් මිලියන 139.9 ක් විය. | හජ් අරමුදලට අදාලව 2021 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර පාලක මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. එම අනුමැතියෙන් පසුව විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ඈ) | 2015 ජූනි 29 දිනැති අංක 01/2015 හා 2015 ජූලි 14 දිනැති අංක 4/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | අදාල චක්‍රලේඛවලට පටහැනිව මිල ගණන් කැඳවීමකින් තොරව දෙපාර්තමේන්තුව සතු අංක WP CAD - 9010 සහ WP KC - 5063 දරන වාහන 02 සෙලින්කෝ රක්ෂණ සමාගම වෙතින් රක්ෂණය කර තිබුණි. | ඉතා කඩිනමින් රක්ෂණය කිරීමේ අවශ්‍යතාව මත හා කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මිල ගණන් කැඳවීමට ප්‍රමාද වන බැවින් මිල ගණන් කැඳවීමකින් තොරව මෙම වාහන දෙක රක්ෂණය කරන ලදී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඉ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | |
| (i) 3.1 වගන්තිය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධයෙන් අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවකට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද සියළුම වාහන සම්බන්ධයෙන් එවැනි පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | වාහනවල ඉන්ධන පරික්ෂාව කඩිනමින් සිදුකර එම වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ii) 3.3 වගන්තිය | ඉන්ධන භාවිතයේ අහිතකර වෙනසක් ඇත්නම් එය හඳුනාගැනීම සඳහා චක්‍රලේඛයෙහි ඇමුණුම 01 හි දක්වා ඇති ප්‍රවාහන සේවා සටහන් මාසිකව සම්පූර්ණ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ප්‍රවාහන සේවා සටහන් මාසිකව සටහන් කර ඒ අනුව කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ඊ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් ලබා ගත යුතුව පවතින නිපුණතා සහ පවත්නා නිපුණතා අතර පරතරය පියවීම සඳහා සිදු කළ යුතු මානව සම්පත් සංවර්ධනය අධ්‍යයනය කිරීමෙන් අනතුරුව දෙපාර්තමේන්තුවට අනන්‍ය වූ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කරමින් පවතින අතර ඉදිරි මාස දෙක ඇතුලත එය සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාන මාරු ලබා ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.70,504 ක, විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය විය යුතු රු.55,448 ක් සහ සේවය හැර ගිය නිලධාරීයෙකුගෙන් අය විය යුතු රු 31,900 .ක ණය මුදල් අවු 05.ක් ඉක්ම වුවද, අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අවස්ථා ගණනාවකදී පියවර රාශියක් ගෙන තිබුණත් ණය ශේෂ අයකර ගත නොහැකි විය. තවදුරටත් ඒ සම්බන්ධ කටයුතු කිරීම ආර්ථික වශයෙන් ඵලදායි නොවන බැවින් ණය කපාහැරීමට භාණ්ඩාගාරයෙන් නැවත ඉල්ලීම් කිරීමට අපේක්ෂා කරමි. | ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතු බව. |

## 2.4 තැන්පතු

----------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 02 සිට වසර 06 දක්වා කාලයක සිට පවතින එකතුව රු.17,422,508 ක් වූ තැන්පතු ශේෂ 17 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාල තැන්පතු මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීමට අදාල රඳවා ගැනීමේ මුදල් වේ. ගොඩනැඟිල්ලේ වැඩ මෙතෙක් නිම කර නොමැති නිසා අදාල කොන්ත්‍රාත් උපදේශන සමාගම වන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව නිර්දේශ කර නොමැති බැවින් එම මුදල් නිදහස් කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට හැකියාවක් නොමැති බව දන්වමි. | කඩිනමින් නිර්දේශ ලබා ගෙන අදාල තැන්පතු මුදල් නිදහස් කිරීමට හෝ ආදායමට බැර කිරීමට කඩිනමින් කටයුතු කළ යුතු බව. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

## 3.1 සැලැසුම් කිරීම

----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන හජ් අරමුදල වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා 2014 පෙබරවාරි 17 දින අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2019 -2020 වර්ෂවල හජ් වන්දනාව සිදුව නොමැති බැවින් 2021 වර්ෂයේදී හජ් අරමුදල සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොමැත. | පවත්නා තත්ත්වයන් මත වෙනස් විය හැකි වුවද ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු බව. |

**3.2** **වත්කම් කළමනාකරණය**

-----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව පවත්වා ගෙන යනු ලබන ගොඩනැඟිල්ල ඉදිකර තිබූ දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම දෙපාර්තමේන්තුව නමට පවරා ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | වසර ගණනාවකට පෙර ලබා දී ඇති දුම්රිය දෙපාර්තමේන්තු ඉඩම ඉතා කඩිනමින් පවරා ගැනීම ප්‍රයෝගිකව ඉතා දුෂ්කර අතර මේ සම්බන්ධයෙන් අමාත්‍යංශය සමඟ සාකච්ඡා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කළ යුතු බව. |

**3.3** **රජයේ නිලධාරීන් ඇප තැබීම**

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව, රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැබීමට කටයුතු කර නොතිබුණි. | ඇප ආඥා පනත අනුව නිලධාරීන් විසින් ඇප තැබීමට කටයුතු කරමින් පවතී. | අදාල විධිවිධාන ප්‍රකාරව ඇප තැබීමට කටයුතු කළ යුතු බව. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

-------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තු කමිටුවක් පත් කර තිරසර සංවර්ධනය පිළිබඳ අවධානය යොමුකර මෙම දෙපාර්තමේන්තුවට අදාලව තිරසර සංවර්ධන අරමුණු හඳුනාගැනීමට අපේක්ෂා කරමි. | තිරසර සංවර්ධන අරමුණු හඳුනාගැනීම කඩිනමින් සිදු කළ යුතු බව. |

## 5. යහපාලනය

--------------

### 5.1 අභ්‍යන්තර විගණනය

-------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 38(i)(ඊ) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වේ. මුදල් රෙගුලාසි 133 ප්‍රකාරවද ගණන්දීමේ නිලධාරි විසින් මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති ස්වකීය රාජකාරී සහ වගකීම ඉටු කිරීම සඳහා තම දෙපාර්තමේන්තුව තුල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතුය. එසේ වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සුදුසු අභ්‍යන්තර විගණකවරයකු පත්කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටින බව දන්වා සිටිමි. | විගණන පනත සහ මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු බව. |

## 6. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 123 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 109 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 25 ක් සහ අතිරික්ත 11 ක් පැවතුණි.<br>ඒ අතුරින් සහකාර අධ්‍යක්ෂ තනතුරු 04 ක් ද, ගණකාධිකාරි සහ අභ්‍යන්තර විගණක යන තනතුරු දෙකද පුරප්පාඩු වී පැවතිම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි බලපෑම් සිදු කරන බව නිරීක්ෂණය විය. | කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු ඉතා කඩිනමින් පිරවීමට අවශ්‍ය පියවර ගනිමින් සිටි. | පුරප්පාඩු පිරවීමට කඩිනම් පියවර ගත යුතු බව. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ අනුමත රියැදුරු තනතුරු 04 ක් පැවතියද, රියැදුරන් තිදෙනෙකු පමණක් සේවයේ නියුතුව සිටීම හේතුවෙන් එක් පුරප්පාඩුවක් පැවතිණි. තවද, වාහන 06 ක් පැවතියද, රියැදුරන් 03 දෙනෙක් පමණක් සිටීම හේතුවෙන් නිරන්තරයෙන් වාහන 03 ක් නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. | රියදුරු පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | රියදුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කර වාහන භාවිතය කාර්යක්ෂම කළ යුතු බව. |